සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் -கொழும்புகல்விவலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

# දෙවන වාර ඇගයීම - 2016
# இரண்டாம் தவணைமதிப்பீடு - 2016
# Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 07 ශ්‍රේණිය<br>தரம் 07<br>Grade 07 | ඉස්ලාම් පත්‍රය<br>இஸ்லாம் வினாத்தாள்<br>Islam Paper | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hour |

## I වන කොටස

- **නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.**

01. "අන්සාරිවරු" යන්න,
i. මක්කා වැසියන් ii. කුෆා වැසියන් iii. හිජ්රත් ගිය අය iv. මදීනා වැසියන්

02. "සුන්නා" යන පදයට සමාන අර්ථයක් ඇති තවත් පදයක්,
i. තබ්ලිහ් ii. හදීස් iii. දඃවා iv. කුර්ආන්

03. අධික සංඛ්‍යාවක් සුහුෆ් පහල කරනු ලැබූ නබිවරයා,
i. ආදම් (අලෛ) ii. නබි (සල්) තුමා iii. ෂිද් (අලෛ) iv. ඉබ්රාහීම් (අලෛ)

04. මදීනාවේ පැරණි නම,
i. මද්යන් ii. යත්රිබ් iii. මක්කා iv. බග්දාද්

05. තවත් කෙනකුගේ අවසරයක් නොමැතිව ලබා ගැනීම,
i. මක්රූහ ii. හලාල් iii. හරාම් iv. ජායිස්

06. "තෑගි හුවමාරු කර ගන්න එමඟින් ඔබලාගේ සෙනෙස අධිකවේ." මෙය,
i. කුර්ආන් වැකියකි ii. උමර් (රලි) තුමාගේ කියමනකි iii. හදීසයකි iv. ඉමාම් ෂාෆි කියමනකි

07. අහ්කාම් සහ සුහුෆ් පහළ කාල නබිවරයා
i. නබි (සල්) තුමා ii. නූහ් (අලෛ) iii. ඊසා (අලෛ) iv. මූසා (අලෛ)

08. අපගේ යහගුණාංග පරලොව්වේ දී අපට,
i. උපකාරි කරයි ii. ඉදිරිපත් වේ iii. සෙවණ ලබාදෙයි iv. කළකිරීමක් ඇතිකරයි

09. ඊමාන් ශාඛා 60 හෝ 70ක් ඇත. එහි පහලම ශාඛාව,
i. අනුන්ට උපකාර කිරීම
ii. ලැජ්ජාශීලි වීම
iii. මාර්ගයේ තිබෙන හානි කරන දේ ඉවත් කිරීම
iv. හොඳ දේ කියා දීම

10. තව මුහාජිරීන් සහෝදරයකු වූ අබ්දුල් රහ්මාන් ඉබ්නු අවුෆ් (රලි) තුමාට තම වස්තුවෙන් අඩක්ම දුන් සහාබිවරයා,
i. අබ්දුල්ලා ඉබ්නු උමර් (රලි)
ii. සාද් ඉබ්නු අබී වක්කාස් (රලි)
iii. සයිද් ඉබ්නු රබීඋ (රලි)
iv. සයිද් ඉබ්නු සාබිත් (රලි)

(10x2=20)

- **පහත් සඳහන් වාක්‍ය හරි නම් "✓" යයිද, වැරදි නම් "×" යයිද වරහන් තුල සඳහන් කරන්න.**

1. මිතුදම එළිදැක්වීම ආය තවත් තහවුරු කරයි. ( )
2. සමාජයේ වෙසෙන ඛෙලිහින්යන් වෙනුවෙන් උර දීම අවශ්‍ය නොවේ. ( )
3. ජීවිතයේ සමහර අංශ සඳහා පමණක් අල්කුර්ආනය මඟ පෙන්වයි. ( )
4. අසභ්‍ය වචන කථාකිරීම ලැජ්ජා නොමැති කමේ ලක්‍ෂණයකි. ( )
5. යහපත් මිතුදම කස්තූරි වෙළෙන්දාට සම වේ. ( )

(5x2=10)

- හිස්තැන් පුරවන්න.

1. නබි (සල්) තුමාණෝ මදීනාවේ යුදෙව්වන් සමග ඇති කර ගත් ගිවිසුම .................................. වේ.
2. අල්කුර්ආනය පහළ වූ රාත්‍රිය .................................. ලෙස විශේෂයෙන් හැඳින්වේ.
3. නබි (සල්) තුමාණන් සහභාවූ යුද්ධයන් .................................. යනුවෙන් හඳුන්වයි.
4. මූද් (අලෛ) තුමාට පහල කරන ලද සුහුෆ් සංඛ්‍යාව ..................................
5. සුභ පැතිම සඳහා අරාබියෙන් .................................. යැයි පවසනු ලැබේ.

(5x2=10)

## II වන කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයේ නිවැරදි පිළිතුරුවලට ලකුණු 16 බැගින්ද අනෙකුත් සෑම ප්‍රශ්නයකම ලකුණු 11 බැගින්ද දෙනු ලැබේ.

01. දෙවන වාර ඇගයීමට උපයෝගී කරගනිමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
i. නබි (සල්) තුමා සහභාගි වූ යුද්ධ තුනක් නම් කරන්න. (ලකුණු3)
ii. අල්ලාහ්ගේ ගුණාංගයන් තුනක් ලියන්න. (ලකුණු3)
iii. මුහාජිරීන්වරු යනු කවරහුද? (ලකුණු2)
iv. අන් අයට උදව් කිරීම තුළින් අල්ලාහ් දයාව ලැබිය හැකි ක්‍රියාවන් තුනක් ලියන්න. (ලකුණු3)
v. ලයිලතුල් කද්ර් කුමන රාත්‍රියේ පැමිණෙන්නේද යන වග නබි (සල්) තුමාණන්හට අමතක කිරීමට හේතු වූ කාරණාව කුමක් ද? (ලකුණු2)
vi. පොදු ස්ථානයක දී අහුලාගත් භාණ්ඩයක් කුමක් කළ යුතුදැයි ලියන්න. (ලකුණු3)

02. i. සුන්නා යනු කුමක් ද පැහැදිලි කරන්න. (ලකුණු3)
ii. අල්කුර්ආනය හා සුන්නාව අතර සම්බන්ධතා තුනක් ලියන්න. (ලකුණු3)
iii. සුන්නතය සම්බන්ධයෙන් අපට ඇති වගකීම් තුනක් ලියන්න. (ලකුණු3)
iv. සුන්නාව අනුගමනය කිරීම පිළිබඳව හදීසයක් ලියන්න. (ලකුණු2)

03. i. ඉස්ලාමයට අනුකූලව මිතුදම පවත්වා ගැනීමට අවශ්‍ය ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු3)
ii. යහපත් මිතුරුකමේ ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු3)
iii. මිත්‍රත්වය හොඳින් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය ක්‍රම වේද තුනක් ලියන්න. (ලකුණු3)
iv. නරක මිතු දමේ විපාක දෙකක් ලියන්න. (ලකුණු2)

04. i. අන් අයගේ නිවසට පිවිසීමේදී අනුගමනය කල යුතු දේ දෙකක් ලියන්න. (ලකුණු3)
ii. අන් අයගේ භාණ්ඩ අනවසරයෙන් භාවිතා කිරීමෙන් ඇතිවන විපාක දෙකක් ලියන්න. (ලකුණු3)
iii. අප ලැජ්ජාශීලිව හැසිරිය යුතු අවස්ථා තුනක් ලියන්න. (ලකුණු3)
iv. ලැජ්ජාශීලි බව ගැන හඳුන්වන හදීසයක් ලියන්න. (ලකුණු2)

05. i. අල්කුර්ආනය පහළ කල අන්දම කෙටියෙන් පහදන්න. (ලකුණු5)
ii. ලෛලතුල් කද්ර් රාත්‍රියේ අප කල යුතු යහ ක්‍රියා තුනක් ලියන්න. (ලකුණු3)
iii. ලෛලතුල් කද්ර් රාත්‍රියේ උසුරීමට නිර්දේශ කල දුආව ලියන්න. (ලකුණු3)

06. i. හිජ්රත් යනු කුමක් ද? (ලකුණු3)
ii. ඉස්ලාම් පවසන ලද යුද නීති තුනක් ලියන්න. (ලකුණු3)
iii. මදීනා සමාජයේ දක්නට ලැබුනු විශේෂ යහ ගුණාංග පහක් ලියන්න. (ලකුණු5)